RARE

# අපරාධ සහ පොලිස් මහජන සම්බන්ධතා පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

(අඹන්පොල පොලිස් බල ප්‍රදේශය ඇසුරිනි)

ඉල්ලුම්කරුගේ නම : ඩබ්. ඒ. එම්. නිමල් ප්‍රේමතිලක

ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් : විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය (සමාජ විද්‍යා) දෙවන පෙළ ඉහළ ගෞරව සමාර්ථ 2009-SL-3780

ඉල්ලුම්කරුගේ විශ්ව විද්‍යලයේ නම : කැලණිය විශ්වවිද්‍යාලය

නිබන්ධය ඉදිරිපත් කරනු ලබන උපාධිය : සමාජීය විද්‍යාපති උපාධිය (දෑ අවුරුදු පාඨමාලාව)

නිබන්ධය ඉදිරිපත් කරනු ලබන වසර හා මාසය : 2014 දෙසැම්බර් 31

ශිෂ්‍ය අංකය : **FGS/S/2001/134/R**

ප්‍රවේශ අංකය: 1161
වර්ග අංකය:

## සාරාංශය

## ''අපරාධ හා පොලිස් මහජන සමබන්ධතා පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්''

''අපරාධ හා පොලිස් මහජන සමබන්ධතා පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්'' යන පර්යේෂණ මාතෘකාවට අදාළව වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹන්පොළ පොලිස් බල ප්‍රදේශය පාදක කොටගෙන එහි සිවල් ආරක්ෂක කමිටු සමාජිකයින්, සිවිල් පුරවැසියන්, පොලිස් නිලධාරීන් (අවු.18-60ත් වයසේ පසුවන) යන අය සමීක්ෂණයට භාජනය කරමින් අධ්‍යයනය සිදු කරන ලදි. අපරාධ නිවාරණය සහ අපරාධ හෙළිදරව් කර ගැනීම පිණිස පොලීසියට ජනතා සහය අනිවාර්යෙන්ම අවශ්‍ය බව මේ පිළිබඳව අධ්‍යයනය කරන ලද සමාජ විද්‍යාඥයින්, මානව විද්‍යාඥයින්, අපරාධ විද්‍යාඥයින් ගේ මතයයි. මෙහිදී ජනතා සහය පොලීසියට ලැබෙන්නේ ද සහ ජනතා සහය ලබාගැනීමට අවශ්‍ය සුදුසුකම් පොලීසිය සපුරන්නේ ද යන්න පුළුල්ව අධ්‍යයනය කරන ලදි.

ඒ අනුව උපදේශකවරයාගේ මඟපෙන්වීම අනුව පර්යේෂණය සඳහා කෘත්‍යාත්මක ක්‍රමය, සමීක්ෂණ ක්‍රමය, ජීවන අත්දැකීම් ක්‍රමය යන පර්යේෂණ ක්‍රමවේද යොදා ගනිමින් ප්‍රාථමික සහ ද්විතියික දත්ත රැස් කිරීම සඳහා නිරීක්ෂණය, ප්‍රශ්නාවලි ලබා දීම, සම්මුඛ සාකච්ඡා යන දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම යොදා ගනිමින් අපරාධ සහ පොලිස් මහජන සම්බන්ධතා යන්නට අදාළව මීට පෙර සිදුකර ඇති පර්යේෂණ හා ලිඛිත මූලාශ්‍ර පරිශීලනය කර පර්යේෂණය සිදුකරන ලදි. ඒ අනුව ලබා ගන්නා ලද පර්යේෂණ දත්ත යොදාගත හැකි ඉතා උචිත දත්ත විශලේශන ක්‍රමයන් යොදා ගනිමින් විශ්ලේශනය කර සවිස්තර සටහන් ලිවීම, දත්ත වගුගත කිරීම, ප්‍රස්ථාර සටහන් මගින් දැක්වීම සිදුකර ඇත.

සමාජය තුළ දිනෙන් දින වැඩිවන අපරාධ අවම කර ගැනීමට පොලීසිය වෙත නොමදව ජනතා සහය ලැබිය යුතු වුවත් එය සාර්ථකව සිදු නොවේ. ඇතැම අවස්ථාවලදී සහය ලැබුණ ද එයින් සෑහීමකට පත්විය නොහැකිය. පොලීසිය ජනතා සහය ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් අදට ද සපුරා නොමැති අතර ජනතාව හා පොලීසිය අතර විශාල දුරස්ථ බවක් මතුව ඇත. අඹන්පොළ පොලිස් බල ප්‍රදේශය තුළ තත්ත්වය රටේ අන් පලාත්වලට ද සමානය.

පොලිස් මහජන සබඳතා තවදුරටත් වර්ධනය කළ යුතු බව පොලිස් දෙපාර්තුමේන්තුවේ නිලධාරීන්, මහජනතාව සහ ජනතා නායකයින් ද අවබෝධ කරගත යුතුය. ඒ සඳහා ජනතාව පොලීසියෙන් දුරස්ථ වීමට බලපාන ලද කරුණු මෙහි පෙන්වා දී ඇති අතර පොලිස් දෙපාර්තමේන්තුව තුළ සිදුවිය යුතු වෙනස්කම් ද මෙහි පෙන්වා දී ඇත. ඒ අනුව තීරක ප්‍රජාව මේ සම්බන්ධයෙන් මැදිහත් විය යුතු බව අධ්‍යයනයෙන් තහවුරු වේ.

මුඛ්‍ය පද : (සිවිල් ආරක්ෂක කමිටු සාමාජිකයින්, පොලිස් මහජන සබඳතා, අඹන්පොළ, අපරාධ, අපරාධ නිවාරණය, අපරාධ හෙළිදරව් කර ගැනීම, ජනතා සහය, පොලිස් දෙපාර්තමේන්තුව)